සැ. යු. - 2013.10.25 වැනි දින පළවූ අංක 1834 දරන ගැසට් පත්‍රයේ I:III කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,835 - 2013 නොවැම්බර් මස 01 වැනි සිකුරාදා - 2013.11.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : I වැනි ඡෙදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | 954 |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... ... | — |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... ... | — |
| රජයේ නිවේදන ... ... ... | 848 |
| මිල පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන ... ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 956 |
| නැවියන්ට දැන්වීම් ... ... ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2013 නොවැම්බර් මස 22 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2013 නොවැම්බර් මස 08 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති. (වැ. බ.).

2013 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.
*මෙම ගැසට් පත්‍රය www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

2013 අංක 340

## ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්වේච්ඡා බලසේනාව

### අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද අධිකාරියට පත්කිරීම හා ඇතුළත් කිරීම

පහත නම සඳහන් මහතා මේජර් නිලයෙන් 2010 සැප්තැම්බර් මස 06 වැනි දින සිට ශ්‍රී ලංකා යුද හමුදා ස්වේච්ඡා බලසේනාවේ හමුදාගත සිවිල් අයවලුන් සඳහා වන පදනම මත අධිකාරියට පත් කිරීම හා එදිනම සිට ශ්‍රී ලංකා යුද හමුදා පොදු සේවා බලකාය වෙත ඇතුළත් කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :

කෙඩෙට් නිලධාරී හෙට්ටිආරච්චිගේ එරික් සිරාන් ප්‍රසන්න කුමාර (කෙනි/33311)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය.

2011 මාර්තු මස 23 වැනි දින,
කොළඹ දී ය.

11-101

---

MOD/DEF/07/01/AVF/WDL/17.

## ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්වේච්ඡා බලසේනාව

### අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද අධිකාරියෙන් ඉවත් කිරීමක්

පහත නම සඳහන් නිලධාරී 2011 ජූලි මස 28 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවේ අධිකාරියෙන් ඉවත් කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :

තාවකාලික මේජර් සමන්ත සංජීව වාකිෂ්ඨ, ශ්‍රීලයුවෛබ (නි/5117)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2011 දෙසැම්බර් මස 30 වැනි දින,
කොළඹ දී ය.

11-121

---

2013 අංක 341

DVF/RECT/280/129/AY.

## ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්වේච්ඡා බලසේනාව

### අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැන්වීමක්

පහත නම සඳහන් නිලධාරී 2011 ජූලි මස 21 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවෙන් විශ්‍රාම ගැන්වීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :

කපිතන් (උපකරණ පාලක - පොදු රාජකාරී) හපන් ජේඩිගේ රංජිත් ප්‍රේමකුමාර, ශ්‍රීලංජාආබමු (නි/6526)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය.

2011 ජූලි මස 27 වැනි දින,
කොළඹ දී ය.

11-122

---

2013 අංක 342

## ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්වේච්ඡා බලසේනාව

### අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද අධිකාරියට පත්කිරීම් හා ඇතුළත් කිරීම්

පහත නම් සඳහන් මහත්වරුන් කපිතන් නිලයෙන් 2010 අගෝස්තු මස 16 වැනි දින සිට ශ්‍රී ලංකා යුද හමුදා ස්වේච්ඡා බලසේනාවේ හමුදාගත සිවිල් අයවලුන් සඳහාවන පදනම මත අධිකාරියට පත් කිරීම හා එදිනම සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදු සේවා බලකාය වෙත ඇතුළත් කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :

(අ) කෙඩෙට් නිලධාරී රන්උලුගේ නිමල් විමලවීර (කෙනි/33308)
(ආ) කෙඩෙට් නිලධාරී කළුදේව කිත්සිරි චන්දන ද සිල්වා (කෙනි/33309)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය.

2011 මාර්තු මස 23 වැනි දින,
කොළඹ දී ය.

11-123

2013 අංක 343

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්වේච්ඡා බලසේනාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද
අධිකාරියට පත්කිරීම් හා ඇතුළත් කිරීම්

පහත නම් සඳහන් කාන්තා කෙඩෙට් නිලධාරිණීන් 2009 ජනවාරි මස 20 වැනි දින සිට ශ්‍රී ලංකා යුද හමුදා ස්වේච්ඡා බලසේනාවේ ලුතිතන් නිලයෙන් අධිකාරියට පත් කිරීම හා එදිනම සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදා පුරෝගාමී බලකාය වෙත ඇතුළත් කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :

කෙනි/32108 කාන්තා කෙඩෙට් නිලධාරිණී කඩවතේ ගෙදර චන්දිමා වසන්ති ධර්මපාල
කෙනි/32109 කාන්තා කෙඩෙට් නිලධාරිණී සුරම්‍යා ටෙරනි හෙට්ටිආරච්චි

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2009 අගොස්තු මස 27 වැනි දින,
කොළඹ දී ය.

11-100

DVF/RECT/278/71/AY.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්වේච්ඡා බලසේනාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද අපකීර්ති
සහගත ලෙස සේවයෙන් පහ කිරීම

**අපකීර්ති සහගත ලෙස සේවයෙන් පහ කිරීම**

පහත නම සඳහන් නිලධාරි 2011 අප්‍රේල් මස 11 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්වේච්ඡා බලසේනාවෙන් අපකීර්ති සහගත ලෙස සේවයෙන් පහ කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :

ලුතිනන් මංජුල ප්‍රසාද් මදරසිංහ, ශ්‍රීලංජාආබමු (නි/5901)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය.

2011 අගෝස්තු මස 30 වැනි දින,
කොළඹ දී ය.

11-124

---

MOD/DEF/09/26/CW/07.

**ජාතික ශිෂ්‍යභට බලකාය**

අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද අධිකාරියෙන් ඉවත් කිරීම

පහත නම සඳහන් නිලධාරි 2013 අගෝස්තු මස 07 වැනි දින සිට ජාතික ශිෂ්‍යභට බලකායේ අධිකාරියෙන් ඉවත් කරනු ලැබීම අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කර ඇත :

නි/5352 2/ලුතිතන් ජේකේජ්සී දහනායක - ජාශිබ

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2013 සැප්තැම්බර් මස 05 වැනි දින,
කොළඹ දී ය.

11-102

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## ඩීඑෆ්සීසී බැංකුව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය ප්‍රකාර (ලංකා සංවර්ධන මුදල් සංස්ථාව යනුවෙන් කලින් හැඳින්වුණු) ඩීඑෆ්සීසී බැංකුව විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනා සම්මතය 2013 අගෝස්තු මස 28 වැනි දින දී ඒකච්ඡන්දයෙන් සම්මත කරගන්නා ලද බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය

ඩීඑෆ්සීසී බැංකුව නමට මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් සුජානි හපුතන්ත්‍රි විසින් ලියා සහතික කරන ලද අංක 952 හා 2010 මාර්තු 16 වැනි දින ද, අංක 1321 හා 2011 ජූනි 23 දින ද, දරන උකස් බැඳුම්කර මත, අයවිය යුතු මුදල් ගෙවීම්, එම්. එන්. සුගතදාස ඇන්ඩ් කොම්පනි (එම්. එන්. සුගතදාස සහ සමාගම) යන නාමය අභිධානය සහ ආයතනය යටතේ කටුගස්තොට ව්‍යාපාරය පවත්වාගෙන යන මාලගම්මන නාරන්ගස්පිටියේ ගෙදර කරුණාරත්න යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද,

2013 ජූලි 31 වැනි දිනට ඉහත කී මාලගම්මන නාරන්ගස්පිටියේ ගෙදර කරුණාරත්න යන අයගෙන් ඩීඑෆ්සීසී බැංකුවට රුපියල් පණස් දෙලක්ෂ හතළිස් තුන් දහස් පන්සිය විසිහතකුත් ශත පණස් හතක (රු. 52,43,527.57) මුදලක් සහ 2013 අගෝස්තු මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එක් එක් වර්ෂයේ සෑම තුන්මසකට වරක් ජනවාරි, අප්‍රේල් ජූලි සහ ඔක්තෝබර් යන මාසවල ව්‍යාපාරික කටයුතු කරන ප්‍රථම දිනයේ දී ප්‍රතිශෝධනය කරන මෙහි පහත දැක්වෙන පාදක පොළී අනුපාතික අතරින් එනම් :

(අ) බර තැබූ මධ්‍යක මූලික ණය පොළී අනුපාතිකයට (ඒ.ඩබ්ලිව්.පී.ආර්.) ආසන්නතම ඉහළ 0.5% ට තීන්දු කරන වාර්ෂික ආනුපාතිකය ; හෝ

(ආ) රඳවා ගැනීමේ බදු අඩුකර ගැනීමෙන් පසු, දවස් 91 මධ්‍යක භාණ්ඩාගාර බිල්පත් පොළී අනුපාතිකයට ආසන්නතම ඉහළ 0.5% ට තීන්දු කරන වාර්ෂික අනුපාතිකය

යන මෙයින් ප්‍රතිශෝධන දිනයේ දී බලාත්මකව පැවති වඩා ඉහළ අනුපාතිකයට සියයට හතක් (7%) ආන්තිකයක් එකතු කළ අනුපාතිකයක් මත රුපියල් දහසය ලක්ෂ හැටහය දහස් හයසිය පණස් හයක් (රු. 16,66,656) සඳහා පොළිය ද සියයට හතකුත් දශම පහක් (7.5%) ආන්තිකයක් එකතු කළ ආනුපාතිකයක් මත, රුපියල් විසිහය ලක්ෂ අසූ තුන් දහස් තුන්සිය විසිහතරක් (රු.26,83,324) සඳහා පොළිය ද ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද,

ඉහත කී උකස් බැඳුම්කර මත අයවිය යුතු මුදල වන රුපියල් පණස් දෙලක්ෂ හතළිස් තුන් දහස් පන්සිය විසිහතකුත් ශත පණස් හතක (රු. 52,43,527.57) මුදල සහ 2013 අගෝස්තු මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එක් එක් වර්ෂයේ සෑම තුන්මසකට වරක් ජනවාරි, අප්‍රේල්, ජූලි සහ ඔක්තෝබර් යන මාසවල ව්‍යාපාරික කටයුතු කරන ප්‍රථම දිනයේ දී ප්‍රතිශෝධනය කරන මෙහි පහත දැක්වෙන පාදක පොළී අනුපාතික අතරින් එනම්:

(අ) බර තැබූ මාධ්‍ය මූලික ණය පොළී අනුපාතිකයට (ඒ. ඩබ්ලිව්. පී. ආර්.) ආසන්නතම ඉහළ 0.5% ට තීන්දු කරන වාර්ෂික අනුපාතිකය ; හෝ

(ආ) රඳවා ගැනීමේ බදු අඩුකර ගැනීමෙන් පසු, දවස් 91 මධ්‍යක භාණ්ඩාගාර බිල්පත් පොළී අනුපාතිකයට ආසන්නතම ඉහළ 0.5% ට තීන්දු කරන වාර්ෂික අනුපාතිකය

යන මෙයින් ප්‍රතිශෝධන දිනයේ දී බලාත්මකව පැවති වඩා ඉහළ අනුපාතිකයට සියයට හතක (7%) ආන්තිකයක් එකතු කළ අනුපාතිකයක් මත රුපියල් දහසය ලක්ෂ හැටහය දහස් හයසිය පණස් හයක් (රු. 16,66,656) සඳහා පොළිය ද සියයට හතකුත් දශම පහක (7.5%) ආන්තිකයක් එකතු කළ අනුපාතිකයක් මත, රුපියල් විසිහය ලක්ෂ අසූ තුන් දහස් තුන්සිය විසිහතරක් (රු. 26,83,324) සඳහා පොළිය ද හෝ විකිණීමේ දිනට එයින් නොගෙවා ඉතිරිව ඇති යම් කොටසක් මීට අදාළ ඉඩම හා පරිශ්‍රය විකිණීම පිළිබඳ ප්‍රචාරක ගාස්තු හා විකිණීමේ ගාස්තු ද 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය ප්‍රකාර එකී උකස් බැඳුම්කරවල ප්‍රතිඥප්ති අනුව ඩීඑෆ්සීසී බැංකුව වැය කර ඇති සියලු මුදල් හා දරා ඇති සියලු වියදම් හා ගාස්තු ද සමග අයකර ගැනීම සඳහා ඉහත කී අංක 952 හා 1321 දරන උකස් බැඳුම්කර මගින් ඩීඑෆ්සීසී බැංකුව වෙත මාලගම්මන නාරන්ගස්පිටියේගෙදර කරුණාරත්න යන අය විසින් උකස් කර ඇති මෙහි පහත විස්තර කරන ඉඩම සහ පරිශ්‍රය මහනුවර බලයලත් වෙන්දේසිකාර අයි. ඩබ්ලිව්. ජයසූරිය මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් සහ සංශෝධිත පරිදි වූ 1955 අංක 35 දරන ලංකා සංවර්ධන මුදල් සංස්ථා පනතින් පැවරී ඇති බලතල යටතේ ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කරයි.

### අංක 952 සහ 1321 දරන උකස් බැඳුම්කර මගින් උකස් කරන ලද දේපළ විස්තරය

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මහනුවර මහ නගර සභා සීමාව ඇතුළත යටිවාවල පිහිටි "කුකුලලවත්ත" යනුවෙන් හැඳින්වෙන හා ප්‍රකට ඉඩමේ, බලයලත් මානක එච්. ජේ. ජේ. සිල්වා මැන සකස් කළ අංක 1423 හා 1956 අගෝස්තු 30 වැනි දින දරන පිඹුරේ ලොට් අංක 1A සහ 1B දරන බිම් කට්ටිවලින් කොටස් වූ බලයලත් මානක පී. ඩබ්ලිව්. විජේවර්ධන මැන සකස් කළ අංක 4114 හා 1989 මාර්තු මස 11 වැනි දින දරන පිඹුරේ ලොට් 3A ලෙස ලකුණු කළ බිම් කොටසෙහි බලයලත් මානක ටී. බී. අත්තනායක විසින් 1994 ජූනි 29 වැනි දින අනුබෙදීමක් කර බෙදා වෙන්කළ ලොට් 3A ලෙස ලකුණු කළ බෙදා වෙන් කළ බිම් කට්ටියට මායිම්, උතුරට : මහනුවර සිට කුරුණෑගලට යන මහා මාර්ගය ද, නැගෙනහිරට : අංක 4114 දරන පිඹුරේ ලොට් අංක 2 හා 3 සහ ඉහත කී අංක 4114 දරන පිඹුරේ ලොට් 3B ද, දකුණට : මහවැලි ව්‍යාපෘතිය සඳහා අත්පත්කරගත් මෙම ඉඩමේ කොටසක් ද, බස්නාහිරට : කොන්ඩදෙණිය ආරච්චිගේ වත්ත ද යන මායිම් ඇතුළත එකී අංක 4114 දරන පිඹුර ප්‍රකාර පර්චස් විසිදෙකකුත් දශම පහක් (අ. 0 රූ. 0 පර්. 22.5) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩමේ බිම සහ එහි පිහිටි ගොඩනැගිලි, ගසකොළ, වැවිලි සහ වෙනත් සියලු දේ. මෙම ඉඩම මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර තිබේ.

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මහනුවර මහ නගර සභා සීමාව ඇතුළත, යටිවාවල පිහිටි "කුකුලලවත්ත" යනුවෙන් හැඳින්වෙන හා ප්‍රකට ඉඩමේ, බලයලත් මානක එච්. ජේ. ජේ. සිල්වා මැන සකස් කළ අංක 1423 හා 1956 අගෝස්තු මස 30 වැනි දින දරන පිඹුරේ ලොට් අංක 1A සහ 1B දරන බිම් කට්ටිවලින් කොටස් වූ බලයලත් මානක පී. ඩබ්ලිව්.

විජේවර්ධන මැන සකස් කළ අංක 4114 හා 1989 මාර්තු මස 11 වැනි දින දරන පිඹුරේ ලොට් 3A ලෙස ලකුණු කළ බිම් කොටසෙහි බලයලත් මානක ටී. බී. අත්තනායක විසින් 1994 ජුනි 29 වැනි දින අනුබෙදීමක් කර බෙදා වෙන් කළ ලොට් 3B ලෙස ලකුණු කළ බෙදා වෙන් කළ බිම් කට්ටියට මායිම්, උතුරට : ඉහත කී අංක 4114 දරන පිඹුරේ ලොට් අංක 2 ද, දකුණු නැගෙනහිරට සහ නැගෙනහිරට ඉහත කී අංක 4114 දරන පිඹුරේ ලොට් අංක 1 ද, බස්නාහිරට : ඉහත කී අංක 4114 දරන පිඹුරේ ලොට් අංක 3 සහ 3A ද යන මායිම් ඇතුළත එකී අංක 4114 දරන පිඹුර ප්‍රකාර පර්චස් හතරක් (අ. 0 රූ. 0 පර්. 4) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩමේ බිම සහ එහි පිහිටි ගොඩනැගිලි, ගසකොළ වැව්ලි සහ වෙනත් සියලු දේ. මෙම ඉඩම මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර තිබේ.

ඒ. එන්. ෆොන්සේකා,
සාමාන්‍යාධිකාරී.

ඩීඑෆ්සීසී බැංකුව,
අංක 73/5, ගාලු පාර,
කොළඹ 03.

11-109

---

## යුනියන් බෑන්ක් ඔෆ් කලම්බු - පී. එල්. සී.

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ යුනියන් බෑන්ක් ඔෆ් කලම්බු පී. එල්. සී. විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තිය ප්‍රකාරව යුනියන් බෑන්ක් ඔෆ් කලම්බු පී. එල්. සී. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2013 සැප්තැම්බර් මස 02 වැනි දින පවත්වන ලද රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ, බිංගිරිය, තල්ගහපිටිය, පෙරකදෝරුවත්ත අංක 385/2 දරන ස්ථානයේ පදිංචි මෙහි මින්මතු උකස්කරු වශයෙන් හඳුන්වනු ලබන හෙට්ටිආරච්චිගේ ෆ්‍රැන්ක් රංගන සම්පත් පෙරේරා නොහොත් හෙට්ටිආරච්චිගේ ෆ්‍රැන්ක් රංගන සම්පත් යන අය විසින් යුනියන් බෑන්ක් ඔෆ් කලම්බු පී. එල්. සී. වෙතින් බැංකු පහසුකම් ලබාගෙන ඇති බැවින් ද, ඉහත කී උකස්කරු විසින් මීගමුව ප්‍රසිද්ධ නොතාරිස් ජී. ඒ. එල්. පී. ධම්මික සිල්වා විසින් සහතික කරන ලද අංක 1477 සහ 2011.05.12 වැනි දින දරන උකස් බැඳුම්කරය ලියා අත්සන් කිරීමෙන් ඉහත කී පහසුකම් නිසා යුනියන් බෑන්ක් ඔෆ් කලම්බු පී. එල්. සී. වෙත අයවිය යුතු රුපියල් හැත්තෑදෙලක්ෂයක (7,200,000) මුදල සහ ඒ මත පොළිය ආපසු ගෙවීම සඳහා ඇපයක් වශයෙන් මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති දේපළ උකස්කොට ඇපයට තබා ඇති බැවින් ද, 2013.07.28 වැනි දිනට රුපියල් හැත්තෑඅටලක්ෂ විසිපන්දහස් හයසිය අනූනවයකුත් ශත දෙකක (රු. 7,825,699.02) මුදල සහ ඉහත සඳහන් ණය පහසුකම් නිසා 2013.07.29 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් ඒ මත පැහැර හරින ලද වාර්ෂික පොළිය එකී උකස්කරුගෙන් යුනියන් බෑන්ක් ඔෆ් කලම්බු පී. එල්. සී. වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව තිබෙන බැවින් ද,

රුපියල් හැත්තෑදෙලක්ෂ නවදහස් අටසිය අටක (රු. 7,209,808.00) මුදල සහ 2012.03.13 දින සිට ඒ මත වර්ෂයකට පොළිය සහ ඉහත කී අංක 1477 දරන බැඳුම්කරය ප්‍රකාරව අයකර ගැනීමට යුනියන් බෑන්ක් ඔෆ් කලම්බු පී. එල්. සී. වෙත හිමිකම් තිබෙන සියලුම වෙනත් මුදල් ප්‍රමාණයන් අයකර ගැනීම සඳහා යුනියන් බෑන්ක් ඔෆ් කලම්බු පී. එල්. සී. වෙත උකසට තබන ලද දේපළ 1990 අංක 04 දරන ඉහත කී පනත ප්‍රකාරව ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට බලයලත් වෙන්දේසිකරු හේමචන්ද්‍ර දළුවත්ත මහතාට බලය පවරන ලද 2012.07.27 දිනැති යෝජනා සම්මතය අවලංගු කිරීමට යුනියන් බෑන්ක් ඔෆ් කලම්බු පී. එල්. සී. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනාවක් සම්මත කර ඇති බැවින් ද,

ඉහත කී ණය ශේෂය ගෙවා පියවා දැමීම ඉහත කී උකස්කරු විසින් පැහැර හැරීම සිදුකර ඇති බවට යුනියන් බෑන්ක් ඔෆ් කලම්බු පී. එල්. සී. විසින් සෑහීමකට පත්වීමෙන් පසුව, යුනියන් බෑන්ක් ඔෆ් කලම්බු පී. එල්. සී. විසින් 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 3 වැනි වගන්තිය ප්‍රකාරව ක්‍රියාකරමින්, රුපියල් හැත්තෑඅටලක්ෂ විසිපන්දහස් හයසිය අනූනවයකුත් ශත දෙකක (රුපියල් 7,825,699.02) මුදල සහ 2013. 07.29 වැනි දින සිට ඉහත කී මුදල මත පැහැර හරින ලද වාර්ෂික පොළිය ද තවද ඉහත කී අංක 1477 බැඳුම්කරය සහ 1990 අංක 4 දරන එකී පනතේ 13 වැනි වගන්තිය ප්‍රකාරව යුනියන් බෑන්ක් ඔෆ් කලම්බු පී. එල්. සී. වෙත අයකර ගැනීමට හිමිකම් ඇති වෙනත් සියලුම මුදල් ප්‍රමාණයන් ද, අයකර ගැනීම සඳහා ඉහත කී අංක 1477 දරන උකස් බැඳුම්කරයේ බලය ප්‍රකාරව සහ ඊට යටත්ව යුනියන් බෑන්ක් ඔෆ් කලම්බු පී. එල්. සී. වෙත උකසට තබන ලද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති දේපළ ඉහත කී 1990 අංක 4 දරන පනත ප්‍රකාරව ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට බලයලත් වෙන්දේසිකරු ත්‍රිවංක ඇන්ඩ් සේනානායක ඔක්ෂනියර්ස් වෙත බලය පැවරීමට 1990 අංක 4 දරන එකී පනතේ 4 වැනි වගන්තිය ප්‍රකාරව මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

#### උපලේඛනය

1. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කුලියාපිටිය ලියාපදිංචි කොට්ඨාසය තුළ කටුගම්පොල හත්පත්තුවේ කිනියාම කෝරළයේ බිංගිරියේ පිහිටි දංගස්පිටියේවත්ත, කොහොඹගහවත්ත, දංගස්පිටියේහේන, දික්හේන නමැති ඉඩමට බලයලත් මනින්දෝරු එච්. ඩබ්ලිව්. නන්දසේන විසින් මැන සාදන ලද අංක 1637 සහ 2004.07.01 දිනැති පිඹුර ප්‍රකාර කැබලි අංක 2 නමැති බෙදා වෙන්කළ බිම් කොටසට මායිම්, උතුරට : මෙම පිඹුරේ කැබලි අංක 1 ද, නැගෙනහිරට : එච්. ඒ. ගයාෂාන් සහ ආර්. එම්. රන්බණ්ඩා යන අයගේ ඉඩම ද, දකුණට : මෙම පිඹුරේ කැබලි අංක 04 සහ 03 ද, බස්නාහිරට : පාර සඳහා වෙන් කිරීම ද, යන මායිම් තුළ පිහිටි අක්කර එකක් (අ. 1 රූ. 0 පර්. 0) විශාල ඉඩම සහ ඒ මත පිහිටි ගොඩනැගිලි, ගහකොළ පළතුරු ආදී සෑම සියලු දේත් සමග ය. මෙම දේපළ කුලියාපිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ M138/229 යටතේ ලියාපදිංචි කර ඇත.

2. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ කුලියාපිටිය ලියාපදිංචි කොට්ඨාසය තුළ කටුගම්පොල හත්පත්තුවේ කිනියාම කෝරළයේ බිංගිරියේ පිහිටි දංගස්පිටියේවත්ත, කොහොඹගහවත්ත, දංගස්පිටියේහේන, දික්හේන නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩී. ඩී. එම්. පීටර් ප්‍රනාන්දු විසින් මැන සාදන ලද අංක 2746 සහ 1991.09.26 දිනැති පිඹුර ප්‍රකාර කැබලි අංක 03 නමැති බෙදා වෙන් කළ බිම් කොටසට මායිම් උතුරට : කැබලි අංක 02 සහ කැබලි අංක 01 දරන අඩි 10ක් පළල පාර සඳහා වෙන් කිරීම ද, නැගෙනහිරට : එච්. එම්. පී. හේරත් යන අයගේ ඉඩම ද, දකුණට : ජේ. එඩී ප්‍රනාන්දු යන අයගේ ඉඩම ද, බස්නාහිරට : එච්. ඒ. ඩබ්ලිව්. ගාමිණී පෙරේරා යන අයගේ ඉඩම ද, යන මායිම් තුළ පිහිටි රූඩ් දෙකකුත් පර්චස් නවයයි දශම හයයි හතක් (අ. 0 රූ. 02 පර්. 9.67) විශාල බිම් කොටස සහ ඒ මත පිහිටි ගොඩනැගිලි, ගහකොළ පළතුරු ආදී සෑම

සියලු දේත් සමග ය. මෙම දේපළ කුලියාපිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ M165/170 යටතේ ලියාපදිංචි කර ඇත.

3. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ කුලියාපිටිය ලියාපදිංචි කොට්ඨාසය තුළ කටුගම්පොළ හත්පත්තුවේ කිනියාම කෝරළයේ බිංගිරියේ පිහිටි දංගස්පිටියේවත්ත, කොහොඹගහවත්ත, දංගස්පිටියේහේන, දික්හේන නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එච්. ඩබ්ලිව්. නන්දසේන විසින් තදනන්තරව මැන සාදන ලද අංක 2999 ඒ සහ 2008.11.24 දිනැති පිඹුර ප්‍රකාර කැබලි අංක 01 නමැති බෙදා වෙන්කළ බිම් කොටසට මායිම් උතුරට : පාර සහ ජේ. කේ. එම්.මැටිල්ඩා පෙරේරා යන අය හිමිකම් කියන ඉඩම ද, නැගෙනහිරට : එච්. එම්. පොඩිමැණිකේ යන අය හිමිකම් කියන ඉඩම ද, දකුණට : ආර්. එච්. රන්බණ්ඩා යන අය හිමිකම් කියන ඉඩමද, බස්නාහිරට : එච්. ඒ. එෆ්. ආර්. සම්පත් පෙරේරා යන අය හිමිකම් කියන ඉඩම ද, යන මායිම් තුළ පිහිටි රූඩ් දෙකයි පර්චස් නවයක් (අ. 0 රූ. 2 පර්. 9) විශාල බිම් කැබැල්ල සහ ඒ මත පිහිටි කොඩනැගිලි, ගහකොළ පළතුරු ආදී සෑම සියලු දේත් සමගය. මෙම දේපළ කුලියාපිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

එස්. ඩී. එන්. එස්. කන්නන්ගර,
අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්.

11-105

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන

## සංශෝධිත ගාස්තු

2013 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

***සියලුම ගැසට් පත්‍ර නියමිත දිනට www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.***

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය. මුදල් ඇණවුම් ගෙවන කාර්යාලය බොරැල්ල තැපැල් කාර්යාලය වේ.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2013 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | රු. ශ. |
|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137 0 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... ... | 1,300 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... ... | 2,600 0 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ *ගැසට් පත්‍රයේ* සෑම කොටසක ම කෙළවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. *ගැසට් පත්‍රය* නොලැබීම, ප්‍රමාද වී ලැබීම සහ ලිපිනය වෙනස් කිරීම් ආදිය කොළඹ 08, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ, මුද්‍රණාලයාධිපතිට දැනුම් දිය යුතු ය.
14. **2013 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | *වාර්ෂික දායක මුදල* *රු. ශ.* | *තැපැල් ගාස්තුව* *රු. ශ.* |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 4,160 0 | 9,340 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 580 0 | 950 0 |
| III වැනි ඡේදය (වෙළඳ ලකුණු සහ පේටන්ට් බලපත්‍ර ආදිය ) ... ... | 405 0 | 750 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව ) ... ... | 890 0 | 2,500 0 |
| II වැනි කොටස (අධිකරණ) ... ... ... ... ... ... ... ... | 860 0 | 450 0 |
| III වැනි කොටස (ඉඩම්) ... ... ... ... ... ... ... | 260 0 | 275 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... | 2,080 0 | 4,360 0 |
| V වැනි කොටස (මගීන් ගෙන යෑමේ අවසර සහ පොත් නාමාවලිය) | 1,300 0 | 3,640 0 |
| VI වැනි කොටස (ජූරිසභිකයින්ගේ හා උපදේශකවරුන්ගේ නාමාවලිය)... ... | 780 0 | 1,250 0 |
| අති විශේෂ ගැසට් පත්‍රය... ... ... ... ... ... ... ... | 5,145 0 | 5,520 0 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

### * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | **පිටපතක මිල** *රු. ශ.* | **තැපැල් ගාස්තුව** *රු. ශ.* |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 0 | 60 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 0 | 60 0 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 0 | 60 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 0 | 120 0 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 0 | 60 0 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 123 0 | 60 0 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 87 0 | 60 0 |

* කොළඹ 05, පොල්හේන්ගොඩ, කිරුළපන මාවතේ, අංක 163 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් තනිපිටපත් මිල දී ගත හැක.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපැලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන්ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

***සැළකිය යුතුයි.*** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2013** | | | |
| නොවැම්බර් | 2013.11.01 | සිකුරාදා | 2013.10.17 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2013.11.08 | සිකුරාදා | 2013.10.25 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2013.11.15 | සිකුරාදා | 2013.11.01 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2013.11.22 | සිකුරාදා | 2013.11.08 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2013.11.29 | සිකුරාදා | 2013.11.15 | සිකුරාදා | දහවල් | 12.00 |
| දෙසැම්බර් | 2013.12.06 | සිකුරාදා | 2013.11.22 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2013.12.13 | සිකුරාදා | 2013.11.29 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2013.12.20 | සිකුරාදා | 2013.12.06 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2013.12.27 | සිකුරාදා | 2013.12.13 | සිකුරාදා | දහවල් | 12.00 |
| | | | **2014** | | | |
| ජනවාරි | 2014.01.03 | සිකුරාදා | 2013.12.20 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.01.10 | සිකුරාදා | 2013.12.27 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.01.17 | සිකුරාදා | 2014.01.03 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.01.24 | සිකුරාදා | 2014.01.10 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.01.31 | සිකුරාදා | 2014.01.17 | සිකුරාදා | දහවල් | 12.00 |

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ. බ.)*

2013 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.